# ශ්‍රී ලංකාවේ පුස්තකාලවල මිල නොමැති වාරසඟරා හා CD/DVD වල මිල තීරණය කිරීමේ මාර්ගෝපදේශය

NATIONAL
LIBRARY
N L S L OF SRI LANKA

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

2023

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රය සඳහා වැදගත් වන ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ සකස් කිරීම ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ඉටු කරන එක් සේවාවකි. ශ්‍රී ලංකාවේ පුස්තකාල ක්ෂේත්‍රයේ ප්‍රධාන රාජ්‍ය ආයතනය වශයෙන් එවැනි සේවා පවත්වාගෙන යාම වගකීමකි. පුස්තකාලයාධිපතිවරුන්ට තම කාර්යයන් ඉටු කිරීමේ දී පහසුවක් ඇති කිරීමත් එම කටයුතුවල ඒකමිතියක් ඇති කිරීමත් මෙවැනි ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ සම්පාදනයේ අරමුණ වේ.

පුස්තකාල එකතුවල අන්තර්ගත වන සම්පත් අතර මිල සඳහන් නොවන වාරසඟරා සහ CD/DVD ද ඇතුළත්ව තිබීම දැකිය හැකි ය. මෙසේ මිල සඳහන් නොවන වාරසඟරා CD/DVD සංඛ්‍යාත්මකව විශාල ප්‍රමාණයක් නොවුව ද ඒවායේ මිල සඳහන් නොවීම ගැටලු මතුවීමට හේතු වී ඇත. පුස්තකාල එකතුවල මූල්‍ය වටිනාකම තක්සේරු කිරීමේ දී මිල සඳහන් නොවන ප්‍රකාශන අන්තර්ගත වීම හේතුවෙන් ගැටලු මතුවන අතර විගණන අවශ්‍යතා සඳහා එවැනි ගණනය කිරීම් සිදුකළ යුතු වේ. එමෙන්ම පුස්තකාල ස්වයංක්‍රීයකරණය වැනි තාක්ෂණික කටයුතුවල දී වාරසඟරා හා CD/DVD හි මිල සඳහන් කිරීම අවශ්‍ය වේ. මීට අමතරව පුස්තකාලවල අස්ථානගත වූ පුස්තකාල සම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ද අස්ථානගත වූ ප්‍රකාශනවල වටිනාකම ගණනය කිරීමට සිදු වන අතර එහිදී ද මිල සඳහන්ව තිබීම අවශ්‍ය වේ.

මේ අනුව පුස්තකාලවල පවත්නා මිල සඳහන් නොවන ප්‍රකාශනවල මිල තීරණය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමේ අවශ්‍යතාව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් හඳුනා ගන්නා ලද අතර, ඒ අනුව මෙම ප්‍රතිපත්තිය සකස් කරන ලදී. මෙම ප්‍රතිපත්තිය සකස් කර තිබෙන්නේ පුස්තකාල කටයුතුවල දී මතුවන අවශ්‍යතාවලට යොදා ගැනීම සඳහා පමණි. ඒ අනුව මෙම ප්‍රතිපත්තිය පුස්තකාලයාධිපතීන්ට තම පුස්තකාලවල කටයුතු සඳහා මාර්ගෝපදේශයක් ලෙස භාවිත කළ හැකිය.

ඩබ්ලිව්. සුනිල්
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

2023 ජනවාරි

## 01. මිල සඳහන් නොමැති වාරසඟරාවල මිල තීරණය කිරීමේ උපකල්පන

**I. වාරසඟරාවේ කඩදාසි වර්ගය (Paper type)**

බැන්ක් කඩදාසි (Bank Papers)

සියලු ම බැන්ක් කඩදාසි (Bank Papers) 70 gsm ලෙස සලකා ඇත.

ආර්ට් කඩදාසි (Art Papers)

සියලු ම ආර්ට් කඩදාසි (Art Papers) 100 gsm ලෙස සලකා ඇත.

II. වාරසඟරාවේ ප්‍රමාණය (Magazine size)

වාරසඟරාවේ ප්‍රමාණය පහත සඳහන් වගුවේ දක්වා ඇති ප්‍රමාණයන්ට අඩු හෝ වැඩිවූ විට, එම ප්‍රමාණය වගුවේ ඇති ආසන්නම වාර ප්‍රකාශනයේ ප්‍රමාණය ලෙස සලකා ඇත.

III. මුද්‍රිත වර්ණය (Colour)

ඒක වර්ණ හා ද්වි වර්ණ මුද්‍රණ සෑම විටම ඒක වර්ණ (One Colour) ලෙස සලකනු ලැබේ.

වර්ණ දෙකකට වඩා වැඩි වන විට සිව් වර්ණ (Four Colour) ලෙස සැලකේ.

(කිසියම් වාරසඟරාවක වර්ණ මුද්‍රිත පිටු අඩංගු වේ නම් සහ එහි වර්ණ පිටු ප්‍රමාණය පිටු16කට හෝ ඊට වඩා අඩුනම් එය තනි වර්ණ මුද්‍රිත වාරසඟරාවක ලෙස සලකනු ලැබේ. එසේ නොවන විට එය වර්ණ මුද්‍රිත වාරසඟරාවක් ලෙස සලකනු ලැබේ)

IV. පිටු ගණන (Number of Pages)

V. වාරසඟරාවක පිට කවරය (Periodical Cover)

වාරසඟරාවක පිටකවරය මිල ගණනය කිරීම් පහසුව සඳහා නොසලකා හරිනු ලැබේ.

## 02. මිල සඳහන් වී නොමැති වාරසඟරාවල මිල තීරණය කිරීමේ නිර්ණායක

| කඩදාසි වර්ගය | | වාරසඟරාවේ ප්‍රමාණය | මුද්‍රිත වර්ණය | | No. of Pages |
|---|---|---|---|---|---|
| Art Paper | Bank Paper | | One Colour | Four Colour | |
| | | 6’’ x 81/2’’ | | | |
| | | 8 ½”x 12’’ | | | |
| | | 5 5/8” x 8 ¾’’ | | | |
| | | 7 ½” x 10” | | | |
| | | 8 ½” x 13 ½” | | | |
| | | 6 ¼” x 10” | | | |

**03.** **මිල සඳහන් වී නොමැති වාරසඟරා වර්ගීකරණය**

"6 x 81/2'' **වාරසඟරා සඳහා**

1. Art Paper –6'' x 81/2'' – one colour
2. Art Paper – 6'' x 81/2'' –four colour
3. Bank Paper – 6'' x 81/2'' – one colour
4. Bank Paper – 6'' x 81/2'' –four colour

"8 ½" x 12'' **වාරසඟරා සඳහා**

5. **A**rt Paper – 8 ½" x 12'' – one colour
6. Art Paper – 8 ½" x 12'' – Four colour
7. Bank Paper – 8 ½" x 12''– one Colour
8. Bank Paper – 8 ½" x 12'' – Four colour

"5 5/8" x 8 ¾'' **වාරසඟරා සඳහා**

9. Art Paper – 5 5/8" x 8 ¾''– one colour
10. Art Paper –5 5/8" x 8 ¾''– Four colour
11. Bank Paper –5 5/8" x 8 ¾''- one colour
12. Bank Paper – 5 5/8" x 8 ¾'' – Four colour

"7 ½" x 10" **වාරසඟරා සඳහා**

13. Art Paper – "7 ½" x 10"– one colour
14. Art Paper – "7 ½" x 10" – Four colour
15. Bank Paper – "7 ½" x 10"– one colour
16. Bank Paper – "7 ½" x 10" – Four colour

8 ½" x 13 ½" **වාරසඟරා සඳහා**

17. Art Paper – 8 ½" x 13 ½"  – one colour
18. Art Paper – 8 ½" x 13 ½"  – Four colour
19. Bank Paper – 8 ½" x 13 ½"  – one Colour
20. Bank Paper – 8 ½" x 13 ½"  – Four colour

6 ¼" x 10" **වාරසඟරා සඳහා**

21. Art Paper – 6 ¼” x 10” – one colour

22. Art Paper – 6 ¼” x 10” – Four colour

23. Bank Paper – 6 ¼” x 10” – one Colour

24.Bank Paper – 6 ¼” x 10” – Four colour

## 04. මිල සඳහන් වී නොමැති වාරසඟරාවල මිල තීරණය කිරීමේ ක්‍රමවේදය

තෝරා ගන්නා ලද මිල සඳහන් නොවන වාරසඟරාවල එක් එක් කාණ්ඩවල මිල තීරණය කිරීමට ජාතික පුස්තකාලයේ ඇති වාරසඟරා සාම්පල් සොයාගැනීමට වූ අපහසුතාවය නිසා රජයේ මුද්‍රණාලය විසින් ලබා දී ඇති ඇස්තමේන්තු සළකා බලා එම ක්‍රමය මේ සඳහා යොදාගෙන ඇත. එහි දී රජයේ මුද්‍රණාලයෙන් ඉදිරිපත් කරන ලද මිල ගණන් හා ප්‍රකාශනවල මිල ගණන් හා ඉතා ආසන්නව ඇති බව නිරීක්ෂණය විය.

වාරසඟරාවල අන්තර්ගතයේ ඇති ගුණාත්මකභාවය සළකාබැලීමේ දී එය තක්සේරු කිරීමට අසීරු බැවින් එය නොසළකා මිල පමණක් ගණනය කිරීමට කමිටුව තීරණය කරන ලදි.

### වාරසඟරාවක් මිල කිරීමේදී සලකා බලන ලද අනෙකුත් කරුණු

I. ලැමිනේටින්, ෆොයිලින්,එම්බෝසින්, වාර්නිෂ් වැනි කවරය අලංකාර කිරීම සඳහා යොදාගනු ලබන ක්‍රමවේද සියල්ල නොසලකා හරිනු ලැබේ.

II. මෙම මිල කිරීමේ ක්‍රමවේදය යටතේ මිල කරන ලද වාරසඟරා මිල සහිත වාරසඟරා ලෙස සැලකිය යුතුය.

## 05.මිල තීරණය කිරීමේ ප්‍රතිපත්තිය සමාලෝචනය

i. මෙම මිලගණන් සළකා බලන ලද්දේ 2022 අප්‍රේල් මාසයේ වෙළඳපළේ තිබෙන නිෂ්පාදන පිරිවැය අනුවය. මිල ගණන් සමාලෝචනය වසර 02කට වරක් සිදුකළ යුතු බව කමිටුවේ මතය විය.

## 06. CD/DVD සඳහා මිල කිරීමේ දී සලකා බලන ලද කරුණු

CD/DVD සඳහා මිල තීරණය කිරීමේ දී එය පොතක අන්තර්ගත සංයුක්ත තැටියක් නම් පොතේ මිලෙන් 25%ක් හෝ රු.200.00 යන මිලෙන් වැඩි අගය සංයුක්ත තැටියේ මිල ලෙස ගණනය කරනු ලැබේ. යම් සංයුක්ත තැටියක් යම් මුද්‍රිත ප්‍රකාශනයක ඩිජිටල් ස්වරූපය (Digital Version) ලෙස ඇතිවිට එය රු.200.00ක් ලෙස මිල තීරණය කරනු ලබයි.

ඇමුණුම i

# මිල සඳහන් නොවන වාරසඟරා සඳහා මිල තීරණය කිරීම

| අනු අංකය | වාරසඟරාවේ ප්‍රමාණය | කඩදාසි වර්ගය | මුද්‍රණ වර්ණය | පිටුවක මිල |
|---|---|---|---|---|
| 1 | 6’’ x 81/2’’ | Art Paper | one colour | 1.10 |
| 2 | 6’’ x 81/2’’ | Art Paper | Four Colour | 2.16 |
| 3 | 8 ½” x 12’’ | Art Paper | one colour | 1.69 |
| 4 | 8 ½” x 12’’ | Art Paper | Four Colour | 2.75 |
| 5 | 5 5/8” x 8 ¾’’ | Art Paper | one colour | 1.10 |
| 6 | 5 5/8” x 8 ¾’’ | Art Paper | Four Colour | 2.16 |
| 7 | 7 ½” x 10” | Art Paper | one colour | 1.19 |
| 8 | 7 ½” x 10” | Art Paper | Four Colour | 2.25 |
| 9 | 8 ½” x 13 ½” | Art Paper | one colour | 1.67 |
| 10 | 8 ½” x 13 ½” | Art Paper | Four Colour | 2.73 |
| 11 | 6 ¼” x 10” | Art Paper | one colour | 1.19 |
| 12 | 6 ¼” x 10” | Art Paper | Four Colour | 2.25 |
| 13 | 6’’ x 81/2’’ | Bank Paper | one colour | 0.97 |
| 14 | 6’’ x 81/2’’ | Bank Paper | Four Colour | 2.03 |
| 15 | 8 ½” x 12’’ | Bank Paper | one colour | 1.45 |
| 16 | 8 ½” x 12’’ | Bank Paper | Four Colour | 2.50 |
| 17 | 5 5/8” x 8 ¾’’ | Bank Paper | one colour | 0.99 |
| 18 | 5 5/8” x 8 ¾’’ | Bank Paper | Four Colour | 2.05 |
| 19 | 7 ½” x 10” | Bank Paper | one colour | 1.17 |
| 20 | 7 ½” x 10” | Bank Paper | Four Colour | 2.24 |
| 21 | 8 ½” x 13 ½” | Bank Paper | one colour | 1.71 |
| 22 | 8 ½” x 13 ½” | Bank Paper | Four Colour | 2.75 |
| 23 | 6 ¼” x 10” | Bank Paper | one colour | 1.22 |
| 24 | 6 ¼” x 10” | Bank Paper | Four Colour | 2.28 |